# වික්ටර් ගී විමංසා

රාජ්‍ය සම්මානලාභී ප්‍රවීණ ලේඛිකා -
**ස්වර්ණාකාන්ති රාජපක්ෂ**

ගීය තුළට පිවිසෑ
ගීයේ ආත්මය
තමාගේ ද ආත්මය කැරැගෙන
අරුතෙහි කිමිඳෑ
රසය ලකර මතු කෙරෙමින්
වික්ටර් රත්නායකයන්ගේ
මුවින් නැගෙන හෙළ ගීයක් ඇසීම
ලෙව්වෑ සිට ලැබිය හැකි
ලොවිතුරා රසයක් කොටෑ
'බ්‍රහ්මාස්වාදයක්' කොටෑ
මම සලකමි.

අරිසෙන් අහුබුදු

ජනානන්දකර මියුරු සර සිය සහජ උරුමය සෙයින් රැගෙන උපන් අග්‍රගණ්‍ය සංගීතවේදී වික්ටර් රත්නායකයන්ට පිදෙන වික්ටර් ගී විමංසා ග්‍රන්ථය අද සෞන්දර්ය විෂයානුබද්ධ




පුස්තකාල සම්පතක් වී තිබේ. කතුවර ප්‍රවීණ ගීත රචක සිසිර දිසානායක සිය අරමුණ මෙසේ වචනයට නඟයි.

ගණන් ඉලක්කම් අතරේම සිරවීමට ඉඩ නොදී සෞන්දර්යයෙන් නැහැවුණු වින්දනය අපට ලබාදුන්නේ වික්ටර් රත්නායක නිර්මාණයි. ඕනෑම විද්‍යාවක් කලාවක් වන්නාසේම ඕනෑම කලාවක් විද්‍යාවක් වන බව පසක් කළේ එම වින්දනයයි.

සිසිර දිසානායක වෘත්තියෙන් සිවිල් ඉංජිනේරුවරයෙකි. අසමාන වූ අප ගාන්ධර්වයාගේ සංගීත නිර්මාණයන්හි මධුර මනෝහරතාවත්, ශාස්ත්‍රානුකූල බවත්, අරුත්සරු බවත් සමසේ මුසු කරමින් රචිත මෙම ශාස්ත්‍රීය කෘතිය පිටු 551 කින් සමන්විත වෙයි. වික්ටර් රත්නායක ප්‍රණාම පර්ෂදය මගින් ප්‍රකාශයට පත්කරන ලද මෙහි කදිම නිමාව සහ මුද්‍රණය ෆාස්ට් ප්‍රින්ටර් සමාගම මගින් ඉටු කරනු ලැබ ඇත.

සඳහන් කළ යුතු තවත් සුවිශේෂී කරුණක් වන්නේ පිටකවරය සරසන වික්ටර් රත්නායකයන්ගේ රුව සිතුවමට නගා ඇත්තේ කතුවරයා විසින්ම වීමයි.

ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ ජීවිතයේ වජ්‍ර ජයන්තිය සමරමින් පෙබරවාරි මස 18 වන දා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති උත්සවයේදී මෙම ග්‍රන්ථය වික්ටර් රත්නායකයන් වෙත පිරිනැමීමට ලැබීමද සිසිරගේ ජීවිතයේ අනුස්මරණීය සටහන් වනු ඇත.

''බොහෝ දෙනෙකු උත්සුක වන්නේ සාහිත්‍ය විචාරය කිරීමටයි. ඒ අපේ ඇබ්බැහිය, පුරුද්ද සහ පුහුණුව කරනකොට ගෙනය. හොඳ සංගීත විචාර කලාව අද අප රටට ආගන්තුකය. මෙහිදී සිසිර ප්‍රමාණාත්මක සාධණීය කාර්යයක නිරත වෙමින් නිර්මිත කලා භූමිකාව අර්ථ ව්‍යක්තිත්වයට පත් කරන්නට මාන බලයි. අමූර්ත නාද ධ්වනි, ශ්‍රැති, ස්වර, කාල ඥාණ සම්ප්‍රයුක්ත භාව. වේග ප්‍රමාණ කිරීම, විචාරය කිරීම ඉසියුම් කටයුත්තකි. ප්‍රබල අභ්‍යාසයකි. ත්‍රිස්ථානශ්‍රේණි ගායන ලීලා සහිත ගාන්ධර්වයෙකුගේ නිර්මාණ භූමිකාව විමසංනය කිරීම කිරෙන් දිය වෙන්කරනවා බඳුය. එයට සංගීත විචාරය මෙන්ම සංගීතමය පරිචය ද, සෞන්දර්ය කලාවේ දාර්ශනික සංකල්ප චින්තාවන් පිළිබඳ දැනුමක් ද සියන් සැකැසිය හැඳියාව, රට දැය බස, සමය හා මිනිසත්බව සම්බන්ධ තියුණු නිමල පිවිතුරු දසුනක් ද අවැසිය.''

මහචාර්ය ප්‍රණීත් අබේසුන්දරයන් විකර්ටර් ගී විමසාවට සපයන ලද පෙරවදනකින් උපුටා ගත් සටහනක් මා මෙසේ උපයෝගී කරගත්තේ සිසිරගේ 'ටජ්මහලය' පිළිබඳ වගතුග කැටිකරගත් මෙම අදහස මගේ සිත්ගත් බැවිනි.

සකුරා මල් උයන සැරිසරන විටක දී දකින සෑම මල් පොකුරක්ම අයස්කාන්තය. එකකට එකක් නොදෙවෙනිය. විකටර් රත්නායකයන්ගේ ගීත නිර්මාණ නමැති සකුරා උයනෙහි සරන රසික සහෘදයාට සිහිල් සුළං ඇල්ලේ, ආදරයේ උල්පත වූ අම්මා, පොඩි කුමාරිහාමියේ, තොටුපොළ අයිනේ, බුදු හාමුදුරුවො අපිත් දකින්නැති, රත්තරං කෙණ්ඩයේ, සිනාදොළක් වන් සිනාමලී, අපි ඔක්කෝම රජවරු, පෙම්බර මධු මගේ, ඇතුළු සිය දහස් ගී මල් අතහැර ඉවත යන්නට නම් සිත් නොදනේනේමය.

සිසිර නමැති නිර්මාණකරුවාගේ කවි හදවතෙහි නැගෙන සංකල්පනා දැන් සිංහල ගීත රසිකයන්යට, විශේෂයෙන්ම මෙල්බර්න් නුවර සංගීත ප්‍රේමීන්ට හුරුපුරුදුය. කෙසේ වෙතත් හරබර ග්‍රන්ථයක් රචනා කරන්නට ඔහු තුළ කෙතරම් ප්‍රබල රසිකත්වයක්, භක්තියක් සංගීතය පිළිබඳ ගවේෂණ ශක්තියක් සහ ප්‍රබෝධක ආවේගයක් තිබුණාදැයි සිතීම පවා විස්මයට තුඩු දෙන්නේය. වික්ටර් ගී නමැති රසමංජරියෙහි නිබඳ කිමිදෙමින් ඔහු කෙබඳු නම් චමත්කාරයක් විඳගත්තාද යන්න සිතීම පවා සතුටට කරුණකි.

විමංසාවට බඳුන්වන ගීතාවලිය පෙළගස්වා ඇති ආකාරය ද අපූරුය. පැහැදිලිය. පිවිසුමට අනතුරු ගී රස නම් යොමුව, ගීයක ආකෘතිය, තනු නිර්මානය, ධ්වනිය, නාද රටා, රිද්මය හා ගායන ආදි වශයෙන් බෙදේ. ගුණ ගී කොටස, බොදු ගී, කිතුණු ගී, මව්ගුණ ගී, පියගුණ ගී වශයෙන් ද ඉන් අනතුරුව අබිමන් ගී, ළබැඳේ ගී, කල්පනා, පෙම්, සුපෙම්, යුග, වියෝ පෙම්, නූර්ති, සිනමා මේ ආදී පුළුල් පරාසයක් කරා විහිදෙයි. ගායනා කළා වූද, සංගීතය සැපයූ ද අනෙක් ගී නිර්මාණ සියල්ල මෙසේ එක්තැන් කොට එහි නිර්මාණකරුවාටම යළි පිදෙන්නේය.

සිසිර දසනායකගේ වික්ටර් ගී විමසාව මෙල්බර්න් නුවර ලේඛක, පාඨක, රසික සංස්කෘතිය ආලෝකමත් කරන පහනක් බඳුය. අපගේ සියලු සහෘදයන් මෙය කියවා බැලිය යුතු වන්නේය. මෙවන් තවත් නිර්මාණයන් රචනා කරන්නට සිසිර දිසානායකයන්ට බොහෝ ශක්තිය ධෛර්යය ලැබේවා යැයි අපි සාඩම්බරයෙන් යුතුව ආසිරි පතමු.



සීතාවක මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා කොළඹ ආනන්ද මහා විද්‍යාලයට ඇතුළත්ව මැනවින් ශිල්ප ශාස්ත්‍ර හදාළ සිසිර දිසානායක වෘත්තියෙන් ඉංජිනේරුවෙකි. ඔහු වඩාත් අප විසින් හඳුනාගෙන ඇත්තේ හරවත් රසවත් ගී පද නිමැවුම් කළ කලාකරුවකු වශයෙනි. ඔහු පිවිසී සිටින්නේ දුෂ්කර වීර්ය පාරමිතාවක් පූරණය කරගැනීමටයි.

ස්වකීය නිර්මාණ ජීවිතයේ සෞභාග්‍ය සශ්‍රීකත්වය අස්වැන්න හැටියට නෙළා සුවහසක් ජනී ජනයා රස අරුතින් පෝෂණය කළ සුභාවිත ගීත කලාවක් උදෙසා අනවරතයෙන් ඇප කැපවූ ගාන්ධර්වයකු වූ ආචාර්ය වික්ටර් රත්නායක පිළිබඳ අධ්‍යයනය එම කාර්යයයි. එහි සත් ඵල මේ කෘතියෙන් විශද වන්නේය.

ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර

